## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

# කාර්මික තාක්ෂණ ආයතනය

### 363, බෞද්ධාලෝක මාවත, කොළඹ - 7

කාර්මික තාක්ෂණ ආයතනය (ITI) පෙර ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය (CISIRI) තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, පර්යේෂණ හා සංවර්ධන, කොන්ත්‍රාත්තුමය පැවරුම්, උපදේශන, අභ්‍යාස හා තාක්ෂණ සේවාවන් මගින් කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා කැපවූ ශ්‍රී ලංකාවේ බහුවිධ පර්යේෂණ ආයතනයකි.

ආයතනයේ, අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරි තනතුර සඳහා උද්‍යෝගිහමත්, ප්‍රවීණසම්පන්න, බුද්ධිමය හා ධෛර්යසම්පන්න ප්‍රමුඛ විද්‍යාඥයෙකු හෝ ඉන්ජිනේරුවරයෙකු බඳවා ගැනීමට බලාපොරොත්තු වේ. අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක ධුරය ආයතනයේ තනතුර වන අතර, ඔහු/ ඇය ඍජුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට වාර්තා කළ යුතුය.

මනා ශාරීරික හා මානසික සෞඛ්‍යතාවයෙන් යුතු හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඔහු / ඇය විශිෂ්ට චරිතයකින් හෙබි හා පහත දැක්වෙන අවම සුදුසුකම් හා පළපුරුද්ද සහිත අය විය යුතුය.

**1. අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරි (HM 2-3)**

**සුදුසුකම් හා පළපුරුද්ද (පහත සඳහන් 1 හෝ 2)**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් විද්‍යාව/ ඉංජිනේරු විද්‍යාව පිළිබඳව පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ සමාර්ථයක් සහිතව විද්‍යාවේදී වසර හතරක කාලයකින් යුත් උපාධිය ලබා තිබීම.

**සහ**

අදාළ විශේෂිත ක්ෂේත්‍රයකින් ලබාගත් ආචාර්ය උපාධිය ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු පිළිගත් ආයතනයක වසර විස්සක (20) අදාළ පළපුරුද්ද මින් වසර අටක (08) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු අතර, වසර පහක (05) ආචාර්ය උපාධියෙන් පසු පළපුරුද්ද සහිත විය යුතුය. ප්‍රකාශන, පේටන්ට් බලපත්‍ර, තාක්ෂණ සංවර්ධන සහ පැවරුම් ඇතුළුව පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හි යහපත් කාර්ය වාර්තා සහිත වියයුතුය.

2. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී වසර හතරක (04) කාලයකින් යුත් උපාධිය ලබා තිබීම.

**සහ**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලබන වෘත්තිය ආයතනයක සංස්ථාපිත සාමාජිකත්වය (වරලත් තත්ත්වය) ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු පිළිගත් ආයතනයක වසර විස්සක (20) අදාළ පළපුරුද්ද මින් වසර අටක් (08) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු අතර, වසර පහක (05) වරලත් තත්ත්වයෙන් පසු පළපුරුද්ද සහිත විය යුතුය. ප්‍රකාශන, පේටන්ට් බලපත්‍ර, තාක්ෂණ සංවර්ධන සහ පැවතුම් ඇතුළුව පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හි යහපත් කාර්ය වාර්තා සහිත විය යුතුය.

**වයස :-** වයස අවුරුදු 40ට නොඅඩු විය යුතුය. නියමිත කාලයට පෙර තනතුර හැර නොයන්නේ නම් හෝ 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 27(5) වගන්තිය ප්‍රකාර තනතුරෙන් ඉවත් නොකරන්නේ නම් අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වසර පහක කාලයක් හෝ සිය වයස 60 සපිරෙන තුරු යන දෙකෙන් පළමුව එළැඹෙන දිනය දක්වා තනතුර දැරිය යුතුය.

**වැටුප් පරිමාණය :-**

HM 2-3 - Rs 173,000-12X4,850-231,200/- (w.e.f. 01.01.2027)

**වැටුප්:** මූලික වැටුප් පියවර - 150,325/-+ රජයේ අනුමත දීමනා

(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1හි විධිවිධාන අනුව : 2025/03/25 දිනැති චක්‍රලේඛ අංක 01/2025)

**වෙනත් ප්‍රතිලාභ**

තෝරාගනු ලබන අයදුම්කරුට කාර්යාලයීය මෙන්ම පෞද්ගලික පරිහරණය සඳහා නිල රථයක් සහ නිවසේදී හා ජංගම දුරකථන පහසුකම් කලින් කලට රජය මගින් පනවනු ලබන වියදම් සීමාවන්ට යටත්ව ලබාදෙනු ඇත. ඔහු හෝ ඇය තනතුරට අදාළ සියලුම රජයේ දීමනාවන්ට, ජීවන වියදම් දීමනාව ඇතුළුව හිමිකම් ලබනු ඇත. ආයතනයේ අර්ථසාධක අරමුදල් යෝජනා ක්‍රමය ආයතනය මගින් ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා සේවකයින් දළ වැටුපින් 10%කින් සහ ආයතනය 15% කින් දායක වනු ඇත. තවද වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායකවිය යුතුය. ඔහු/ ඇය ආයතනය මගින් ක්‍රියාත්මක කරන කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා සහ වෙනත් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන්ටද හිමිකම් ලබයි.

- දැනට රජයේ දෙපාර්තමේන්තුවල/ රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය. අයදුම්පතේ පිටපතක් කලින් ඍජුව එවිය හැකිය.
- අයදුම්පත ඉදිරිපත් කිරීමේදී ITI වෙබ් අඩවියේ (www.iti.lk) දී ඇති ආකෘතිය භාවිත කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටී. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනකුගේ නම් සහ ලිපිනයන් සමග 2026.06.30 දින හෝ ඊට පෙර පහත දක්වා ඇති ලිපිනයට සභාපතිවරයා වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරි තනතුර" සඳහන් කරන්න. මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා කරුණාකර https//www.iti.lk/vacancies/ වෙත පිවිසෙන්න.

**සභාපති,**
**කාර්මික තාක්ෂණ ආයතනය,**
**363, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**